# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/06/EP/03/විදේශ සේවා/2025 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2025.06.19 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම නියෝජ්‍ය/සහකාර සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමනාකරුවන් ,
සියළුම සංවර්ධන නිළධාරින්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිළධාරින්

**<u>තරුණ තරුණියන් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයට අයත් ප්‍රාදේශිය ආයතනවල ජපන් භාෂා පුහුණු පාඨමාලාව පැවැත්වීම - 2025</u>**

තරුණ තරුණියන් සඳහා ජපන් භාෂා ප්‍රවීණතාවය ලබාදීම වෙනුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය හා එක්ව 2023/2024 වර්ෂවල ප්‍රාදේශීය ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථාන ගණනාවකදි පාඨමාලා පවත්වන ලදි. මේ යටතේ ජාත්‍යන්තර ජපන් භාෂා විභාග වන (JLPT/NAT) N5 විභාග සමතුන් 242 ක් හා N4 විභාග සමතුන් 30 දෙනෙකු සිටි. ඔවුන් අතරින් 24 දෙනෙකු ජපානයේ රැකියා බලා ගොස් ඇති අතර 20 දෙනෙකු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ පෙර විගමනික පුහුණුව මේවන විට ලබමින් සිටි.

02. මෙම ජපන් භාෂා පුහුණු වැඩසටහන් 2025 වර්ෂයේදි පැවැත්වීම පිළිබඳව දිර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කිරිමක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේදි 2025.04.29 දින පවත්වන ලද අතර පහත සඳහන් තීරණ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරිමට දෙපාර්ශවය එකගතාවයට එළඹෙන ලදි.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ දිස්ත්‍රික් මධ්‍යස්ථාන 6ක ජපන් භාෂා පුහුණු පාඨමාලා මේවන විට අඛණ්ඩව පවත්වන අතර එම මධ්‍යස්ථාන වල ජපන් භාෂා පාඨමාලා හැදෑරිම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් යොමු කරන සිසු සිසුවියන් සඳහා වැඩි අවස්ථාවක් සලසා දිම.(එම මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය මගින් එවන ලද ලිපියේ සඳහන් කර ඇත.අදාල ලිපියේ පිටපතක් මෙයට අමුණා ඇත.)

- මීට අමතරව ඇතිවන ඉල්ලුම මත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නව දිස්ත්‍රික් මධ්‍යස්ථාන 6 කද පාඨමාලා අලුතින් ආරම්භ කිරිම. එම මධ්‍යස්ථාන පිළිබඳවද තොරතුරු මෙන්ම පාඨමාලාවල සිසුන් බඳවා ගැනිමේ සුදුසුකම් හා වැඩිදුර තොරතුරු ඇමුණුම් ලිපියේ දක්වා ඇත.

- මීට අමතරව ඔබ විසින් යොමු කරන ලබන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව නව පාඨමාලා සංවිධානය කිරිමට අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් කාර්යංශයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරිම.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramull

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28877** |
| | | **Hot Line :0112-889007** | | | |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය මගින් පවත්වනු ලබන ජපන් භාෂා පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තු අය කිරීම පහත සඳහන් පරිදි වේ.

| පාඨමාලාව | පුහුණු ගාස්තු (රු) |
|---|---|
| ජපන් භාෂා ප්‍රවීනතාවිභාගය සඳහා N5 (පැය 300) | 12000.00 |
| ජපන් භාෂා ප්‍රවීනතාවිභාගය සඳහා N4 (පැය 300) | 12000.00 |

එමෙන් ම පාඨමාලා පැවැත්වෙන දිනයන් පහත සඳහන් පරිදි වන අතර N5 පාඨමාලාව සඳහා ඉගැන්වීම් පැය 300 ක් ද N4 පාඨමාලාව සඳහා අතිරේක පැය 300 ක් ලෙස පංති පවත්වනු ඇත.

I. සතියේ දිනයන්හි පාඨමාලා - පෙ.ව.8.30 - ප.ව.4.30
ii.සති අන්ත දිනයන්හි පාඨමාලා - පෙ.ව. 8.30 - ප.ව.4.30

මෙම වැඩසටහන සඳහා තරුණ තරුණියන් තෝරා ගැනිමේදී 2025 වර්ෂයේ ක්‍රියාත්මක අස්වැසුමලාභී හා සමෘද්ධි සහනාධාරලාභී පවුලක්ව සිට සවිබලගැන්වීමේ වැඩසටහනට ඇතුලත් පවුල්වල තරුණ තරුණියන් සඳහා ප්‍රමුඛතාව ලබාදීම වැදගත්වේ.

ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ ජපන් භාෂා පාඨමාලා හැදෑරීම සඳහා කැමැත්තක් හා උනන්දුවක් දක්වන තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු ඇමුණුම් අංක 1 අනුව තොරතුරු සම්පූර්ණ කර 2025.07.31 දිනට ප්‍රථම samurdhimarketing@gmail.com යන ඊමේල් ලිපිනය වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:- 1.ලේකම්-ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යංශය -කා.දැ.ගැ.පි
2. සාමාන්‍යාධිකාරි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය - කා.දැ.ගැ.පි.
3. අතිරේක සාමාන්‍යාධිකාරි (ජාත්‍යන්තර කටයුතු) - කා.දැ.ගැ.පි.
4. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි පුහුණු හා බඳවා ගැනීම් -කා.දැ.ගැ.පි. හා ඔබගේ ඉල්ලීම මත 2023-2024 වර්ෂවල සමෘද්ධි පුහුණු පාඨමාලා පැවැත්වූ පුහුණු උපදේශකයන්ගේ තොරතුරු ද මේ සමඟ ඉදිරිපත් කරමි.

**තරුණ තරුණියන් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයට අයත් ප්‍රාදේශිය ආයතනවල ජපන් භාෂා පුහුණු පාඨමාල පැවැත්වීම - 2025**

**ජපන් භාෂා පාඨමාලා හැදෑරිමට උනන්දුවක් දක්වන තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු**

දිස්ත්‍රික්කය:-

| අනු අංක | ප්‍රා.ලේ.කොට්ඨාශය | ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම | ලිපිනය | ස්ත්‍රී/ පුරුෂ | උපන් දිනය | වයස අවුරුදු | වට්ස්ඇප් දුරකතන අංකය | ඉගෙනිමට උනන්දුවක් දක්වන SLBFE ආයතනයේ දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ නම(තොරතුරු දන්නේ නම්) | සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ව්‍යාපෘති කළමනාකරු/නිළධාරි යාගේ නම /තනතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.......................................................... ..........................................................

දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු

(නිලමුද්‍රාව)

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம்
**Sri Lanka Bureau of Foreign Employment**

SLSI SYSTEM CERTIFIED ISO 9001

නො. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
இல 234, டென்சில் கொப்பேகடுவ மாவத்தை, கொஸ்வத்த, பத்தரமுல்ல, இலங்கை.
No. 234, Denzil Kobbekaduwa Mawatha, Koswatta, Battaramulla, Sri Lanka.

(1985 අංක 21 දරණ පනතින් සංස්ථාපිතයි) (1985 ஆம் ஆண்டின் 21 ஆம் இல. சட்டத்தின் கீழ் கூட்டிணைக்கப்பட்டது) (Incorporated by Act No. 21 of 1985)


මගේ අංකය / எனது இல / My No. TIC/2/47

ඔබේ අංකය / உங்கள் இல / Your No.

දිනය / திகதி / Date 2025.06.12

අධ්‍යක්ෂක ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
04වන මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල

අවධානය : එම්.පී.එස්.එස්.කිත්සිරි මහතා
අධ්‍යක්ෂක අලෙවි (රා.ආ)

17 JUN 2025

**තරුණ තරුණියන් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අයත් ප්‍රාදේශිය ආයතනවලින් ජපන් භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම - 2025**

---

උක්ත කරුණ සම්බන්ධව යොමු කරන ලද ඔබගේ අංක DCD/HO/06/EP/03 විදේශ රැකියා 2025 හා 2025.05.27 දිනැති ලිපිය හා බැඳේ.

2. ඉහත ලිපියේ සඳහන් පරිදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ජපන් භාෂාව හැදෑරීමට රුචිකත්වයක් දක්වන සිසුන් කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානවල පවත්වන ජපන් භාෂා පුහුණු පාඨමාලාවලට යොමු කිරීම සම්බන්ධයෙන් 2025.04.29 දින පැවැති සාකච්ඡාවේදී දෙපාර්ශවය එකඟතාවයට එළඹෙන ලදි.

3. ඒ අනුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පවත්වනු ලබන ජපන් භාෂා පුහුණු පාඨමාලා සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් යොමු කරනු ලබන සිසු සිසුවියන් සඳහා වැඩි අවස්ථාවක් ලබා දීමට කාර්යාංශය තීරණය කර ඇත. දැනට දිස්ත්‍රික් මධ්‍යස්ථාන 06ක ජපන් භාෂා පුහුණු පාඨමාලා පවත්වන අතර, ඇතිවන ඉල්ලුම අනුව නව මධ්‍යස්ථාන 06ක පාඨමාලා ආරම්භ කිරීමට කාර්යාංශය අදහස් කර ඇත.

4. ජපන්භාෂා පුහුණු පාඨමාලා පවත්වන මධ්‍යස්ථාන හා යෝජිත මධ්‍යස්ථාන සම්බන්ධවන තොරතුරු මෙන්ම බඳවාගැනීමේ සුදුසුකම් හා පාඨමාලාව සම්බන්ධව වැඩිදුර තොරතුරු ඇමුණුම 01 හි ඉදිරිපත් කර ඇත.

5. ඔබ විසින් යොමු කරනු ලබන සිසුන් සංඛ්‍යාව අනුව නව පාඨමාලා සංවිධානය කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් කාර්යාංශය අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

පී.ජී.පී.එස්.යාපා
අතිරේක සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර කටයුතු)
සභාපති වෙනුවට

පිටපත් - සාමාන්‍යාධිකාරී - කාරුණික දැනගැනීම පිණිස.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු හා බඳවාගැනීම) - අවශ්‍ය කටයුතු සඳහා.
ජ්‍යෙෂ්ඨ කළමණාකරු -දකුණු පළාත්/වයඹ පළාත්/බස්නාහිර පළාත්/උතුරු මැද පළාත්/මධ්‍යම පාළාත්/ඌව පළාත්/ සබරගමු පළාත් - පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා.



CS CamScanner

ඇමුණුම- 01

**ජපන් භාෂා පාඨමාලා ආරම්භ කිරීම සඳහා අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම.**

රැකියා සඳහා ජපානයේ පවතින ඉල්ලුම සැළකිල්ලට ගෙන එම රැකියා සඳහා කැමැත්තක් දක්වනු ලබන සිසුන් සඳහා ජපන් භාෂා පාඨමාලා දිස්ත්‍රික් මට්ටමින් පිහිටි කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානවල දී ආරම්භ කිරීම සිදු කරනු ලබයි.

ඒ අනුව, මේ පිළිබඳව උනන්දුවක් දක්වනු ලබන පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමි.

01. මේ වන විට පහත සඳහන් මධ්‍යස්ථානවල ජපන් භාෂා පාඨමාලාවන් ක්‍රියාත්මක කෙරේ. ( N5/N4)
- පන්නිපිටිය පුහුණු මධ්‍යස්ථානය - අංක.241/1, පරන පාර, පන්නිපිටිය
- තංගල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානය - යාවත්ත, ගොඩලමුව, තංගල්ල
- පොළොන්නරුව දිස්ත්‍රික් මධ්‍යස්ථානය - අංක.63, නව නගරය. පොළොන්නරුව
- ගාල්ල දිස්ත්‍රික් මධ්‍යස්ථානය - අංක 289, කොළඹ පාර, මහමෝදර, ගාල්ල
- මහනුවර විගමණික සම්පත් මධ්‍යස්ථානය - අංක 18, හිරුස්සගල පාර, මුල්ගම්පල. මහනුවර
- රත්නපුර විගමණික සම්පත් මධ්‍යස්ථානය - අංක 89/6, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර

02. පහත සඳහන් මධ්‍යස්ථාන වල ඔබ විසින් යොමු කරනු ලබන සිසුන් ප්‍රමාණය පදනම් කර අදාල පාඨමාලා සම්බන්ධව ද අප විසින් කටයුතු සංවිධානය කර ඇත.
- හලාවත - මයික්කුලම. කොළඹ පාර,හලාවත
- අනුරාධපුර - අංක 29, අභය පෙදෙස, 03වන පටුමග, අනුරාධපුර
- බදුල්ල - අංක 202. බදුල්ල පාර. හාලි ඇල
- මතුගම - බණ්ඩාරනායක මාවත, මතුගම වත්ත. මතුගම
- දඹුල්ල - අංක 03. නිශ්ශංක මාවත. දඹුල්ල
- මොනරාගල දිස්ත්‍රික් මධ්‍යස්ථානය - බිබිල පාර. හුලන්දාව, මොනරාගල

03. ජපන් භාෂා පාඨමාලාව හැදෑරීමට උනන්දුවක් සහ සුදුසුකම් සපුරා ඇති සිසුන් ඉහත සඳහන් මධ්‍යස්ථානයන් වෙත යොමු කරන ලෙසත් එලෙස යොමු කරන සිසුන්ගේ නාම ලේඛනයක් අදාල මධ්‍යස්ථානයට හා පුහුණු කර්මාන්ත හා ආයතනික අංශයේ off2_trndomestic@slbfe.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

04. මේ සඳහා සිසුන් යොමු කිරීමේ දී පහත සඳහන් සුදුසුකම් හා උපදෙස් සම්පූර්ණ කර තිබිය යුතු බව දන්වා සිටිමි.
- අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනිසිටි සිසුන් විය යුතුයි.
- වයස අවුරුදු 18-28 අතර වීම
- උස අඩි 5 අඟල් 2 (සෙ.මී.150) වැඩි වීම.
- වර්ණ අන්ධතාවය නොමැති වීම.
- ශරීරයේ පච්ච කොටා නොතිබීම.
- මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත වීම
- ජපානයේ අධ්‍යාපනය සඳහා වීසා අයදුම් කළ අයෙකු නොවිය යුතුයි.
- පාඨමාලාවට අදාල නිල ඇඳුමින් සැරසී සහභාගී විය යුතුය. (පිරිමි ළමුන් සඳහා - සුදු කමිසය, කළු කලිසම - ගැහැණු ළමුන් සඳහා සුදු Blouse හා කළු කලිසම)

CS CamScanner

05. පාඨමාලා සම්බන්ධ තොරතුරු

- පාඨමාලා පැවැත්වන දිනයන්

I. සතියේ දිනයන්හි පාඨමාලා - පෙ.ව.8.30 - ප.ව.4.30
II. සති අන්ත දිනයන්හි පාඨමාලා - පෙ.ව.8.30 - ප.ව.4.30

- පාඨමාලා ගාස්තු අයකිරීම.

| පාඨමාලාව | පුහුණු ගාස්තු (රු) |
|---|---|
| ජපන් භාෂා ප්‍රවීනතා විභාගය සඳහා N5 (පැය 300) | 12,000.00 |
| ජපන් භාෂා ප්‍රවීනතා විභාගය සඳහා N4 (පැය 300) | 12,000.00 |

- පාඨමලා කාලසීමාව - පැය 300

මෙම කාලසීමාව තුල දී සෑම පුහුණුලාභියකු විසින්ම අවම පැය 240 ක (80%) ඉගෙනීමේ කාලසීමාවක් සම්පූර්ණ කල යුතු වේ.

06. සමෘද්ධි දෙපාර්තමේන්තුවේ පසුගිය ජපන් භාෂා පාඨමාලා පැවැත්වූ ජපන් භාෂා පුහුණු උපදේශක මහත්ම මහත්මීන්ගෙන් කාර්යාංශය හා එක්ව ජපන් භාෂා පාඨමාලා පැවැත්වීමට කැමති පුහුණු උපදේශක මහත්ම මහත්මීන්ගේ ජීව දත්ත පත්‍රිකා off2_trndomestic@slbfe.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කරන් මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ඊට අමතර මේ සම්බන්ධව වෙනත් උපදෙස් හා තොරතුරු ඔබ ආයත නය වෙත ලබා දීමට කටයුතු කරන බව වැඩි දුරටත් දන්වා සිටිමි.

(අවසන්)

CS CamScanner